# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

பொலிஸ் ஊடகப் பிரிவு

POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.11.30 පැය 0935 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/2150/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


## අනාරක්ෂිතව පවතින ස්ථාන නැරඹීමට නොපැමිණෙන ලෙසට මහජනතාව දැනුවත් කිරීම - පොලිස් මූලස්ථානය.

දිවයිනට බලපා තිබෙන හදිසි අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් විනාශ වූ සියලු මාර්ග සහ පාලම් කඩිනමින් යථා තත්ත්වයට පත් කිරීමේ සියලු කටයුතු මේ වන විට මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ආරම්භ කර ඇත.

එලෙස විනාශ වූ ස්ථාන නැරඹීමට අවට මහජනතාව විශාල වශයෙන් පැමිණෙන බවට මේ වන විට නිරීක්ෂණය වී ඇත. එසේ පැමිණීම ඉතා අනාරක්ෂිත තත්ත්වයක් වන බැවින්, විනාශයට පත් පාලම්, මාර්ග ඇතුළු අනාරක්ෂිතව පවතින ස්ථාන නැරඹීමට නොපැමිණෙන ලෙස පොලිසිය මහජනතාවගෙන් ඉල්ලා සිටී.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**